# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE


| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/03/01/i/පොදු | ඔබේ අංකය<br>உனது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2022.04.29 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**දකුණු පළාත් සභාවේ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු /ආයතනවල සේවාවන් සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/3/6/MT/1 හා 2023.04.27 දිනැති ලිපිය හා බැඳේ.

02. දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් 2022.03.31 දින පැවති පළාත් ලේකම්වරුන්ගේ විශේෂ සාකච්ඡාවේදී එළඹි තීරණ අනුව බලශක්තිය කළමනාකරණය කිරීමේ අරමුණින් දකුණු පළාත් සභාවේ රාජ්‍ය ආයතන අප්‍රේල් 04 දින සිට මැයි 01 දින දක්වා අඟහරුවාදා හා සිකුරාදා දිනවල විවෘත කිරීමකින් තොරව නිවසේ සිට රාජකාරි කිරීමට නිලධාරීන් හට ලබා දුන් අවස්ථාව 2022.05.02 දිනෙන් අවසන් වේ.

03. ඒ අනුව, **2022.05.02 දින සිට දකුණු පළාත් සභාවේ සියලු ආයතන සතියේ දිනවල විවෘත කර සාමාන්‍ය පරිදි පවත්වා ගෙන යා යුතු බව** දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි කාරුණිකව දන්වා සිටිමි.

04. එසේම, සේවා අවශ්‍යතාවය මත සෙනසුරාදා දින කාර්යාලය විවෘත කිරීමට බාධාවක් නොමැති නමුත් **ඉරිදා, පෝය හා අනෙකුත් රජයේ නිවාඩු දිනවල කාර්යාලය විවෘත කිරීමට අවශ්‍ය වන්නේ නම්, ඒ සම්බන්ධයෙන් මා වෙතින් විශේෂ අනුමැතිය ලබාගත යුතු බව** වැඩිදුරටත් දන්වා සිටිමි.

05. තවද, මෙම සම්බන්ධයෙන් ඔබ අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට අයත් අනෙකුත් සියළුම ආයතනවල නිලධාරීන් වෙත ද නොපමාව දැනුම් දීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"සෞභාග්‍යමත් දකුණු පළාතක්"